ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

ඇබෑර්තු

පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා, සුදුසුකම්ලත් ශ්‍රී ලාංකිකයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය.

01. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් / නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - HM-1-3 (තනතුරු 01)

සුදුසුකම් :

බාහිර, (පහත 1 හෝ 2)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යා / විද්‍යා / රාජ්‍ය පරිපාලන / ව්‍යාපාර පරිපාලන / කළමනාකරණ හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්.

    සමග

    සමාජ විද්‍යා / විද්‍යා / රාජ්‍ය පරිපාලන / ව්‍යාපාර පරිපාලන / කළමනාකරණ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (මාස්ටර්ස්) හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

    සහ

    සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / රජයේ, ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක "කළමනාකරණ තලයේ" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

02. තනතුරට අදාළ ක්ෂේත්‍රයෙහි, පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය.

    සහ

    සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / රජයේ ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක "කළමනාකරණ තලයේ" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

අභ්‍යන්තර : (පහත 1 හෝ 2)

01. ඉහත බාහිර අයදුම්කරුවන්හට නියමිත සුදුසුකම් ලබා තිබීම.
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයෙහි, ජ්‍යෙෂ්ඨ කළමනාකරු වර්ගීකරණයෙහි (HM - 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවයක් සම්පූර්ණ කොට තිබීම.

- **වයස :** අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව බලපාන්නේ නැත.

- **වැටුප් කේතය හා සේවක වර්ගීකරණයෙහි මාසික වැටුප් පරිමාණය :**

  DMS චක්‍රලේඛය 2/2016(I)(01.01.2020) - HM 1-3
  (රුපියල් - 86,865 - 15X2270 - 120,915)
  අංක 02/2016 (I) චක්‍රලේඛයෙහි II (A) උපලේඛනය ප්‍රකාරව 2018.01.01 දිනට මූලික වැටුප් පියවර රුපියල් 68,817.00 වේ.

- **වෙනත් ප්‍රතිලාභ :**

  ඉහත තනතුර සඳහා, මූලික වැටුපට අමතරව රජය මගින් අනුමත කළ ජීවන වියදම් දීමනාව. වාහන / ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනාවද අනෙකුත් රජයේ අනුමත ප්‍රතිලාභ සමග ගෙවනු ලැබේ.

- **බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

  පත්කිරීමේ බලධාරියා විසින් පත්කළ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගැනීම සිදු කෙරේ.

02. අධ්‍යක්ෂ / කළමනාකරු (නීති) - HM-1-1 (තනතුරු 01)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් :

නීතිඥයකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී තිබීම සහිතව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක්

සමග

නීති අංශයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම්

සහ

රජයේ හෝ පුද්ගලික අංශයේ ආයතනයක, කළමනාකරණ තලයේ, අදාළ ක්ෂේත්‍රයේ, අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

01. ඉහත බාහිර අයදුම්කරුවන්හට නියමිත සුදුසුකම් ලබා තිබීම
02. නීතිඥ ක්ෂේත්‍රයේ, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරු වර්ගීකරණයේ (MM) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

03. අධ්‍යක්ෂ / කළමනාකරු (නීතිය ක්‍රියාත්මක කිරීම) - HM-1-1 (තනතුරු 01)

සුදුසුකම් ;

බාහිර : (පනත 1 හෝ 2)

01. නීතිඥයකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී තිබීම සහිතව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අපරාධ විද්‍යාව පිළිබඳ හෝ LLB ප්‍රථම උපාධියක් **සමග**

    පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම,

    සහ

    සංස්ථාවක. ව්‍යවස්ථාපිත මණ්ඩලයක. රජයේ ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක "කළමනාකරණ තලයේ" අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක්

    සමග

    පොලිස් අධිකාරී තනතුරක හෝ අවම වශයෙන් වසර 05 ක් ඇතුළත්ව පොලිස් සේවයේ අවම වසර 12 ක පළපුරුද්ද.

අභ්‍යන්තර : (පහත 1 හෝ 2)

01. ඉහත බාහිර අයදුම්කරුවන්හට නියමිත සුදුසුකම් ලබා තිබීම.
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරු වර්ගීකරණයේ (MM) I ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

04. සායනික මනෝවිද්‍යාඥ - HM-1-1 (තනතුරු 01)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් :

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මනෝවිද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,

    සමග

    ශ්‍රී ලංකා වෛද්‍ය මණ්ඩලයේ ලියාපදිංචිය සහිතව, සායනික මනෝවිද්‍යා හෝ සමාන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම,

    සහ

    සංස්ථාවක. ව්‍යවස්ථාපිත මණ්ඩලයක / රජයේ ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක "කළමනාකරණ තලයේ" අවම වසර 12 ක පළපුරුද්ද සහිත වසර දෙකක (02) සායනික පසුබිමක සායනික මනෝවිද්‍යාඥයකු ලෙස පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

01. ඉහත බාහිර අයදුම්කරුවන්හට නියමිත සුදුසුකම් ලබාතිබීම
02. කළමනාකරු වර්ගීකරණයේ (MM I) I ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම සමග සායනික මනෝවිද්‍යා පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම.

වෙනත් (ඉහත 02, 03, 04 තනතුරු සඳහා)

- **සේවක වර්ගීකරණයේ වැටුප් කේතය හා මාසික වැටුප් පරිමාණය :**

  DMS චක්‍රලේඛ 2/2016 (I) (01/01/2020) - HM 1-1
  (රුපියල් (80,295 - 15X2270 - 114,345.00)
  අංක 02/2016(I) චක්‍රලේඛයේ උපලේඛනය II(A) ප්‍රකාරව, 2018.01.01 දින සිට මූලික වැටුප් පියවර රුපියල් 63,589.00 වේ.

- **වයස :** අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය.

- **වෙනත් ප්‍රතිලාභ :**

  මූලික වැටුපට අමතරව, ඉහත තනතුර සඳහා, රජය විසින් අනුමත කළ ජීවන වියදම් දීමනාව, වාහන / ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනාව සමග අනෙකුත් රජයේ අනුමත ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

- **බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

  පත්වීම් සිදුකිරීමේ බලධාරියා විසින් පත්කළ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ.

05. සහකාර අධ්‍යක්ෂ / සහකාර කළමනාකරු (මාධ්‍ය හා තොරතුරු) - MM-1-1 (තනතුරු 01)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජනසන්නිවේදන / ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ විශේෂ උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් අදාළ උපාධියක්

සහ

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකක (02) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් : (ඉහත 1 හෝ 2)

01. ඉහත බාහිර අයදුම්කරුවන්හට නියමිත සුදුසුකම් ලබා තිබීම.
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM) වර්ගීකරණයේ තනතුරක ඇවම වශයෙන් වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

- **සේවක වර්ගීකරණයේ වැටුප් කේතය හා මාසික වැටුප් පරිමාණය :**

  DSM චක්‍රලේඛය 2/2016 (I) (01/01/2020) - MM 1-1
  (රුපියල් 53,175- 10X1,375 - 15X1,910 - 95,575.00)
  DSM චක්‍රලේඛ අංක 02/2016(I) උපලේඛනය II ප්‍රකාරව, 2018.01.01 දින සිට මූලික වැටුප් පියවර රුපියල් 42,161.00 වේ.

- **වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව බලපාන්නේ නැත.

- **බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

  පත්වීම් සිදුකිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරගකාරී විභාගයක සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරාගැනීම් සිදු කෙරේ.

06. වැඩ සටහන් නිලධාරී - JM 1-1 (තනතුරු 01)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යා / සමාජයීය විද්‍යා / සෞඛ්‍ය ප්‍රවර්ධන හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර එකක පශ්චාත් සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, ළමුන් හෝ උපදේශනයන්ට අදාළ වන විෂයයන්ගෙන් ඩිප්ලෝමාවක්, සතුවීම අමතර වාසිදායක වනු ඇත.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)

01. ඉහත බාහිර අයදුම්කරුවන්හට නියමිත සුදුසුකම් ලබා තිබීම.
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "සහායක නිලධාරී වර්ගීකරණයේ" (MA 03) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකොට තිබිය යුතුය.
03. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර - තාක්ෂණවේදී නොවන" (MA I) II ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

07. මාධ්‍ය හා තොරතුරු නිලධාරී - JM 1-1 (තනතුරු 01)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂ ජනමාධ්‍ය උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ එක් වසරක පශ්චාත් සුදුසුකම්.

අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2 හෝ 3)

01. ඉහත බාහිර අයදුම්කරුවන්හට නියමිත සුදුසුකම් ලබාතිබීම.
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "සහායක නිලධාරී වර්ගීකරණයේ" (MA 03) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.
03. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර - තාක්ෂණවේදී" (MA 2) II ශ්‍රේණිය / "කළමනාකරණ සහකාර - තාක්ෂණවේදී නොවන" (MA 1) II ශ්‍රේණිය තනතුරක, අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

වෙනත් (ඉහත 06, 07 තනතුර සඳහා)

- **සේවක වර්ගීකරණයේ වැටුප් කේතය හා මාසික වැටුප් පරිමාණය :**

  DMS චක්‍රලේඛ 2/2016 (I) (01/01/2020) - JM 1-1
  (රුපියල් 42,600- 10X755 - 18X1,135 - 70,580.00)
  DMS චක්‍රලේඛ 02/2016 (I) උපලේඛනය II ප්‍රකාරව, 2018.01.01 දිනට මූලික වැටුප් පියවර රුපියල් 33,770.00 වේ.

- **වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

- **බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

  පත්වීම් සිදුකිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත තෝරාගැනීම් සිදු කෙරේ.

08. පරිවර්තක (ඉංග්‍රීසි) - MA - 4 (තනතුරු 01)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ඉංග්‍රීසි විෂයයක් ලෙස ඇතුළත් ප්‍රථම උපාධියක් සමග අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව. ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවටත්, සිංහල

භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවටත් පරිවර්තනය කටයුතුවල එක් වසරක පළපුරුද්ද තිබිය යුතුය.

භාෂා පරිවර්තන කටයුතුවල ඩිප්ලෝමාවක් සතුවීම අමතර වාසිදයක වනු ඇත.

09. පරිවර්තක (දෙමළ) - MA - 4 (තනතුරු 01)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, දෙමළ විෂයයක් ලෙස ඇතුළත් ප්‍රථම උපාධියක් සමග අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව, දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවටත්, සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවටත් පරිවර්ථන කටයුතුවල එක් වසරක, පළපුරුද්ද තිබිය යුතුය.

භාෂා පරිවර්ථන කටයුතුවල ඩිප්ලෝමාවක් සතුවීම අමතර වාසිදයක වනු ඇත.

වෙනත් (ඉහත 08, 09 තනතුරු සඳහා)

සේවක වර්ගීකරණයේ වැටුප් කේතය හා මාසික වැටුප් පරිමාණය :

DMS චක්‍රලේඛ 2/2016 (I) (01/01/2020) - MA - 4
(රුපියල් 37,970 + 10X755 - 15X930 - 5X1135 - 65,145.00)
DMS චක්‍රලේඛ අංක 02/2016 (I) උපලේඛනය II ප්‍රකාරව, 2018.01.01 දිනට ඉහත මූලික වැටුප් පියවර රුපියල් 30,074.00 වේ.

- **වයස :** අවුරුදු 23 ට අඩු නොවිය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.
- **බඳවා ගැනීමේ ක්‍රම වේදය :**

පත්කිරීම් සිදුකිරීමේ බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම් සිදු කෙරේ.

10. ගිණුම් සහකාර - MA - 3 (තනතුරු 01)

සුදුසුකම් (පහත 1 හෝ 02)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මූල්‍ය / ගණකාධිකරණ / වාණිජ්‍ය / කළමනාකරණ / ව්‍යාපර පරිපාලන ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්.

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීයවල හෝ ආයතනයකින් ලබාගත් අත්තර් මධ්‍ය සාමාර්ථයක් සමග එක් වසරක සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්ද.

11. අන්තර්ජාල ආවේක්ෂණ සහකාර - MA 3 - (තනතුරු 01)

සුදුසුකම් (පහත 01 හෝ 02)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්‍ෂණ ප්‍රථම උපාධියක්.

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමාවක් සමග ප්‍රථම උපාධියක්.

12. විමර්ශණ සහකාර - MA 3 - (තනතුරු 01)

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අපරාධ විද්‍යා ප්‍රථම උපාධියක්.

13. නීති සහකාර - MA 3 - (තනතුරු 01)

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම නීති උපාධියක් සමග නීතිඥවරයකු වීම.

14. වැඩසටහන් සහකාර - MA 3 - (තනතුරු 02)

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජවිද්‍යා / සමාජීය විද්‍යා / සෞඛ්‍ය ප්‍රවර්ධන හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ළමයින්ට අදාළව එක් වසරක ඩිප්ලෝමාවක් සඳහා ප්‍රමුඛතාවය.

15. චිකිත්සක - (තනතුරු 01)

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, මනෝවිද්‍යා / සමාජ විද්‍යා / සෞඛ්‍ය ප්‍රවර්ධන / විශේෂ අවශ්‍යතා පිළිබඳ අධ්‍යාපනය / කථන හා ශ්‍රවණ විද්‍යාව / නාට්‍ය හා රංගකලාව ක්ෂේත්‍රයන්හි ප්‍රථම උපාධියක්.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් උපදේශන ඩිප්ලෝමාවක්.

16. දිස්ත්‍රික් ළමා ආරක්ෂණ නිලධාරී - MA 3 - (තනතුරු 04)

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජයීය විද්‍යා / සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රථම උපාධියක් හෝ වෙනත් අදාළ උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ, රජයේ සංස්ථාවක, මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ ආයතනයක පශ්චාත් වෘත්තීය පළපුරුද්ද අවම වසර එකක (01)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ළමයින් හෝ උපදේශන ක්ෂේත්‍රයට අදාළ විෂයයන්ගෙන් යුත් එක් අවුරුදු ඩිප්ලෝමාවක් තිබීම අමතර වාසිදයක වනු ඇත.

17. දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරී - MA 3 - (තනතුරු 11)

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මනෝවිද්‍යා / සමාජවිද්‍යාව / සෞඛ්‍ය ප්‍රවර්ධන / කථන හා ශ්‍රවණ අවශ්‍යතා / විශේෂ අවශ්‍යතා පිළිබඳ අධ්‍යාපනය / අධ්‍යපන නාට්‍ය හා රංගකලාව ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සමග රජයේ සංස්ථාවක, මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ ආයතනයක, සුදුසුකම් ලැබීමෙන් පසුව අවම වසර එකක (01) පළපුරුද්ද.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් එක් අවුරුදු උපදේශන ඩිප්ලෝමාවක් සතුවීම වාසිදයක වනු ඇත.

18. ප්‍රාදේශීය ළමා ආරක්ෂන නිලධාරී - MA 3 - (තනතුරු 70)

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජයීය විද්‍යා උපාධියක් හෝ වෙනත් අදාළ උපාධියක්.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් එක් අවුරුදු උපදේශන ඩිප්ලෝමාවක් සතු වීම අමතර වාසිදයක වනු ඇත.

වෙනත් (ඉහත 10-18 දක්වා තනතුරු සඳහා)

- **සේවක වර්ගීකරණයේ වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය :**

  DMS චක්‍රලේඛ 2/2016 (I) (01/01/2020) - MA 3-3
  (රුපියල් 32,200- 10x445 - 11x660 - 10x730 - 5x750 - 54,960.00)
  DMS චක්‍රලේඛ අංක 02/2016 (I) හි උපලේඛනය II ප්‍රකාරව, 2018.01.01 දිනට මාසික වැටුප් පියවර රුපියල් 23,360.00 වේ.

- **වයස :**

  අවුරුදු 23 කට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ගට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- **තෝරාගැනීමේ ක්‍රමවේදය :**

  පත් කිරීම් සිදු කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම් සිදු කෙරේ.

19. කළමනාකරණ සහකාර (තාක්ෂණ) - MA 2-1 - (තනතුරු 05)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් :

තෘතීයික හා වෘත්තීය අධ්‍යයන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයක් විසින් නිකුත් කළ, ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම (IT / කාර්යාල කළමනාකරණ)

අභ්‍යන්තර අයදුම්කරුවන් ;

ඉහත බාහිර අයදුම්කරුවන් හට නියමිත සුදුසුකම් ලබා තිබීම.

- **සේවක වර්ගීකරණ වැටුප් කේතය හා මාසික වැටුප් පරිමාණය :**

  DMS චක්‍රලේඛ 2/2016 (I) (01/01/2020) - MA 2-1
  (රුපියල් 30,310- 10x300 - 7x350 - 4x495 - 20x660 - 50,940.00)
  DMS චක්‍රලේඛ 02/2016 උපලේඛනය II ප්‍රකාරව, 2018.01.10 දිනට මූලික වැටුප් පියවර රුපියල් 24,030.00 වේ.

- **වයස :**

  අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ගට මෙම ඉහළ වයස් සීමාව බලපාන්නේ නැත.

- **බඳවාගැනීමේ ක්‍රමවේදය :**

  පත් කිරීමේ බලධාරීන් විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම් සිදු කෙරේ.

20. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - MA 1-1 - (තනතුරු 04)

සුදුසුකම් : පොදු

බාහිර අයදුම්කරුවන් :

ඇ) අ.පොස. (සා/පෙළ) විභාගය, එක්වරකදී
   i. සිංහල / දෙමළ
   ii. ඉංග්‍රීසි භාෂාව
   iii. ගණිතය
   යන විෂයයන් ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සහිතව විෂයයන් හයකින් සමත්වීම.

ආ) අ.පොස. (උ/පෙළ) විභාගයෙන් විෂයයන් තුනක් (පොදු ප්‍රශ්න පත්‍රය හැර) සමත් වීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :

ප්‍රාථමික තලයේ - පුහුණු, ප්‍රාථමික තලයේ - අර්ධ පුහුණු හා ප්‍රාථමික තලයේ - නුපුහුණු වර්ගීකරණයේ හා පහත සඳහන් සුදුසුකම් සතු සේවකයන් අයදුම්කිරීම සඳහා සුදුසුකම් ලබති.

අධ්‍යාපනික :

අ.පොස. (සා/පෙළ) විභාගයෙන්
   i. සිංහල / දෙමළ
   ii. ඉංග්‍රීසි භාෂාව
   iii. ගණිතය
   යන විෂයයන් ඇතුළුව සම්මාන ගනරක් සහිතව විෂයයන් හයකින් සමත්ව සිටිය යුතුය.

වෙනත් :

ඉහත සේවක වර්ගීකරණය යටතේ, ස්ථිර තනතුරක, අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවාකාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

- **සේවක වර්ගීකරණයේ වැටුප් කේතය හා මාසික වැටුප් පරිමාණය :**

  DMS චක්‍රලේඛ 2/2016 (I) (01/01/2020) - MA 1-1
  (රුපියල් 27,910- 10x300 - 7x350 - 4x495 - 20x660 - 48,540.00)
  DMS චක්‍රලේඛ 02/2016 උපලේඛනය II ප්‍රකාරව, 2018.01.01 දිනට මූලික වැටුප් පියවර රුපියල් 22,126.00 වේ.

- **වයස :**

  අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ගට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- **බඳවාගැනීමේ ක්‍රමවේදය :**

  පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම් සිදු කෙරේ.

21. රියදුරු - PL 3 (තනතුරු 01)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් :

01. අ.පොස. (සා/පෙළ) විභාගයෙන්, උපරිම දෙවාරයකට නොවැඩි වාර ගණනකදී, අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සමග විෂයයන් හයකින් (06) සමත් වීම.

සමග

02. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බලපත්‍රයක් (බර වාහන පැදවීම සඳහා මෝටර් රථ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ වලංගු බලපත්‍රය) තිබිය යුතු අතර, එම බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වසර තුනක (03) පළපුරුද්ද සතුවීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :

01. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බලපත්‍රයක් (බර වාහන පැදවීම සඳහා මෝටර් රථ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ වලංගු බලපත්‍රය) තිබිය යුතු අතර, එම බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වසර තුනක (03) පළපුරුද්ද සතුවීම,

සහ

02. නුපුහුණු (PL 1) වර්ගීකරණයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවයක් සම්පූර්ණ කොට තිබීම.

- **සේවක වර්ගීකරණයේ වැටුප් කේතය හා මාසික වැටුප් පරිමාණය :**

  DMS චක්‍රලේඛ 2/2016 (01/01/2020) - PL 3
  (රුපියල් 26,290- 10x270 - 10x300 - 10x330 - 12x350 - 39,490.00)
  DMS චක්‍රලේඛ අංක 02/2016 උපලේඛනය II ප්‍රකාරව, 2018.01.01 දිනට ඉහත පරිදි, මූලික වැටුප් පියවර රුපියල් 20,842.00 වේ.

- **වයස :**

  අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ගට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- **බඳවාගැනීමේ ක්‍රමවේදය :**

  බඳවාගැනීම්, වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරේ.

22. පණිවුඩකරු - PL 1 (තනතුරු 01)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් :

01. අ.පො.ස. (සා/පෙළ) විභාගයට පෙනී සිටි අය,

සහ

02. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ වලංගු මෝටර් සයිකල් බලපත්‍රය.

23. කම්කරු - PL 1 (තනතුරු 01)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් :

01. අ.පො.ස. (සා/පෙළ) විභාගයට පෙනී සිටි අය.

වෙනත් (ඉහත 22 සිට 23 දක්වා)

- **සේවක වර්ගීකරණ වැටුප් කේතය හා මාසික වැටුප් පරිමාණය :**

  DMS චක්‍රලේඛ 2/2016 (01/01/2020) - PL 1
  (රුපියල් 24,750- 10x250 - 10x270 - 7x300 - 15x330 - 37,000.00)
  DMS චක්‍රලේඛ අංක 02/2016 උපලේඛනය II ප්‍රකාරව, 2018.01.01 දිනට ඉහත පරිදි, මූලික වැටුප් පියවර රුපියල් 19,622.00 වේ.

- **වයස :**

  අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

- **බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

  පත්කිරීම් පිළිබඳ බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ.

ප්‍රතිලාභ :

මූලික වැටුපට අමතරව, ඉහතින් සඳහන් කළ සියලුම තනතුරු සඳහා ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ. එසේම අධිකාරිය විසින් 12% හා 3% වශයෙන් සේ.අ. අරමුදලට හා සේවක අරමුදලට පිළිවෙලින් දායකත්වය දරනු ඇත.

පොදු කොන්දේසි :

සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු අතර, මනා චරියකින් යුක්ත විය යුතුය. එසේම, තනතුරුවලට අදාළ රාජකාරි මනා ලෙස ඉටුකිරීම පිණිසත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් සුදුසු ශාරීරික හා මානසික තත්ත්වයකින් සිටිය යුතුය.

අත්සන් කළ අයදුම්පත්, ජීව දත්ත සහිතව හා සහතික කළ සියලු සහතිකපත්වල පිටපත් සහිතව (අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් ඇතුළත්ව) ලියාපදිංචි තැපෑලෙන් පමණක්, පහත සඳහන් ලිපිනයට, **2019 ජනවාරි 07 වන දිනට හෝ ඊට පෙර** ලැබීමට සැලැස්විය යුතුය. එක් තනතුරකට වඩා ගනණකට අයදුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, ඒ සඳහා වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුයි.

අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ, අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. රාජ්‍ය අංශයේ / සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ.

ඉහත තනතුරු සඳහා දැනටමත් අයදුම් කොට ඇති අයදුම්කරුවන් යළින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

අසම්පූර්ණ, අපැහැදිලි සහ ඉහත අවශ්‍යතා සම්පූර්ණ නොකරන හා ප්‍රමාදව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. මේ සම්බන්ධව බලපෑම් කිරීම සුදුසුකම අහෝසි කිරීමට හේතුවනු ඇත. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති,
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,
අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.
වෙබ් අඩවිය : www.childprotection.gov.lk